**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ රෝහල් ඕවර්සියර් තනතුර සඳහා බඳවා ගැනීමට පැවති ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේ උපදෙස් පත්‍රිකාව**

**බඳවා ගැනීමට අදාළ මූලික සුදුසුකම්**

**1. අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම්**

- සම්මාන දෙකක් සහිතව සිංහල/දෙමළ, ගණිතය විෂයයන් ඇතුළත්ව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) සමත් වී තිබීම.

සහ

- අපේක්ෂකයා විසින් ඉහත සුදුසුකම් අ.පො.ස. (සා.පෙළ) දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්පූර්ණ කර තිබිය යුතුය.

හෝ

- 2012.07.27 දිනට පෙර සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ තනතුරු සඳහා බඳවා ගෙන සේවයේ ස්ථිර කර ඇති නිලධාරීන්ට හා තනතුරට අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 හෝ ඊට ඉහළ මට්ටමේ සහතිකයක් ලබා ඇත් නම් ඉහත දැක්වූ අධ්‍යාපන සුදුසුකම් අදාළ නොවනු ඇත.

**2. පළපුරුද්ද**

රෝහල් ඕවර්සියර් තනතුර සඳහා PL 01 හෝ PL 02 වැටුප් පරිමාණය ලබන තනතුරක අවම වශයෙන් වසර 15ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් 2025.07.15 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

සහ

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍ර ලේඛ 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති වීම.

සහ

නියමිත පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් හෝ ඉන් නිදහස් කල සේවකයෙකු වීම.

**යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන ආකාරය**

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨත්වය | 40 | 40% |
| 2. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 35 | |
| 3. තනතුරට අදාළ පළපුරුද්ද | 20 | |
| 4. සම්මුඛ පරීක්ෂණය | 05 | |

**1. ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු 40 ලබා දෙන ආකාරය**

- 2025.07.15 දිනට වසර 15කට වඩා වැඩි සේවා කාලය සඳහා රා.සේ.කො.ස. චක්‍රලේඛ 01/2019, 01/2019 (1)හි දක්වා ඇති උපදෙස් පරිදි ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු 40 ලබා දෙනු ලැබේ.
- එසේ සලකා බලනු ලබන කාලය සඳහා වැටුප් වර්ධක උපයා ගෙන තිබිය යුතුය.

3. අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු 35ක් ලබා දෙන ආකාරය

I. අ.පො.ස. (උ.පෙළ) අධ්‍යාපන සුදුසුකම් සඳහා - ලකුණු 24 (උ.පෙළ සමත් විය යුතුය)
II. වෙනත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සඳහා - ලකුණු 11 .

<u>අ.පො.ස. (උ.පෙළ) අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු 24 ලබා දෙන ආකාරය</u>

| අ/අ | ලකුණු ලබා දීමේ නිර්නායක | සාමාර්ථයක් සඳහා හිමිවන ලකුණු ප්‍රමාණය | | | |
|---|---|---|---|---|---|
| | | A | B | C | S |
| 1 | පැරණි විෂයය නිර්දේශය යටතේ (විෂයන් 4 සහිත) | 6 | 5.25 | 4.5 | 3 |
| 2 | නව විෂයය නිර්දේශය යටතේ (විෂයන් 3 සහිත) | 8 | 7 | 6 | 4 |

- අපේක්ෂකයෙකු විසින් ඉහළම සමාර්ථය ලැබූ වාරයට අදාළව විෂයයන් සඳහා ලබා ඇති සාමාර්ථයන්ට අදාළව පමණක් ඉහත ලකුණු ලබා දෙනු ලැබේ.

4. <u>වෙනත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සඳහා ලකුණු 11 ලබා දෙන ආකාරය</u>

| අ/අ | ලකුණු ලබා දීමේ නිර්නායක | ලබා දෙන ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1 | ප්‍රථම උපාධියේ සිට ඉහල ඇති ඕනෑම උපාධි සුදුසුකමක් සඳහා | 04 |
| 2 | උසස් ඩිප්ලෝමා / ඩිප්ලෝමා සඳහා | 03 |
| 3 | සහතික පත්‍ර පාඨමාලා (මාස 12 ට වඩා වැඩි) | 02 |
| 4 | සහතික පත්‍ර පාඨමාලා (මාස 12 ට වඩා අඩු) | 01 |
| 5 | 1 සිට 4 දක්වා ඇති සුදුසුකමක් හෝ සුදුසුකම් කිහිපයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ඇත්නම් | 01 |

**4. තනතුරට අදාළ පළපුරුද්දට අදාළව ලකුණු 20 ලබා දෙන ආකාරය**

අයදුම්කරු PL 01 හෝ PL 02 යන තනතුරුවලට අදාළව 2025.07.15 දින දක්වා සේවා කාලය සඳහා එක් වර්ෂයකට ලකුණු 02 බැගින් උපරිම ලකුණු 20ක් ලබා දේ. (වසර 15 හැර ඉතිරි වසර සඳහා)

තනතුරට අදාළ පළපුරුද්ද ඇගයීමේ දී රා.සේ.කො.ස. චක්‍රලේඛ අංක 01/2020, 01/2020(1) හා 01/2020(11) අනුව තනතුරට අදාළ පළපුරුද්ද ඇගයීම කළ යුතුය.

**5. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු 05 ලබා දෙන ආකාරය**

I. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරු සමඟ හුවමාරු කර ගන්නා අදහස්, තොරතුරු හා සාමාන්‍ය ප්‍රශ්න අවබෝධකර ගැනීම සහ එම ප්‍රශ්න සඳහා කරුණු ඉදිරිපත් කරනු ලබන ආකාරය ඇගයීම මෙහිදී සිදු වේ.